**පස්සර ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

**---------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 14 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 26 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් 09 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු රු.983,635 ක් සඳහා ගිණුම්වල වෙන්කිරීම් කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කිරිමට එකඟ වෙමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ පරිසර බලපත්‍ර 07 ක් නිකුත් කිරීම වෙනුවෙන් ඉදිරියට ගෙවන ලද රු.16,333 ක් වර්ෂයේ ආදායමක් ලෙසට ගිණුම් ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කිරිමට එකඟ වෙමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමි ශේෂය රු රු.200,000 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කිරිමට එකඟ වෙමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය රු.393,891 ක් වුවද, රු.500,000 ක් ලෙසට ගිණුම්වල දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | නිවැරදි කිරිමට එකඟ වෙමි. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම</u>

විගණන නිරීක්ෂණය

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | | | |
| (i) | (21)2 වන වගන්තිය | ප්‍රාදේශිය සභා මංමාවත් 452 ක් ලේඛනයක ඇතුළත් කර තිබුණද, ගැසට් පත්‍රය මඟින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් මැනුම් කටයුතු ප්‍රමාදවී ඇති අතර,ඉදිරියේදි මාර්ග කීපයක් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | 47(1) හා 49(ආ) වගන්ති | 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සැලසුම් අනුමත කළ නව ඉදිකිරීම් 13 ක් සඳහා ගොඩනැඟිලි ඉදිකිරිම සම්බන්ධව අනුකූලතා සහතික නිකුත් කර නොතිබුණි. | අනුකූලතා සහතික නිකුත් කළ යුතුවේ. | අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කරමි. |
| (iii) | 134(1) වගන්තිය | දියුණු ගම් ප්‍රදේශයන් තුළ නව ඉදිකිරීම් හා දියුණු කළ ගොඩනැඟිලි හඳුනාගෙන දේපළ තක්සේරු කර නව ගාස්තු අය කර නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | දේපළ තක්සේරුවේ මුලික සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත.2020 වර්ෂයේදී වරිපනම් තක්සේරුව සිදු කරමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | 2004,2006 හා 2014 වර්ෂවල අවස්ථා තුනකදී ලබාදී තිබුණු රු.88,496 ක අග්‍රිම මුදල් පියවාගෙන නොතිබුණි. | අග්‍රිම පියවා ගත යුතුවේ. | ආදායකයාගේ තොරතුරු සොයා ගැනීමට උපදෙස් ලබාදී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 486 හා 189 | 1996 සිට 2004 දක්වා වර්ෂවලදී ආදායම් පියවා ගැනීම සඳහා සභාවට ලැබුණු චෙක්පත් 03 ක් අගරුවී තිබුණු අතර,ඊට අදාළ රු.75,712 ක වටිනාකම අය කරගෙන නොතිබුණි. | ආදායම් අයකරගැනීමට කටයුතු කළ යුතුවේ. | වසර 20 ක පමණ කාලයක සිට පැවත එන ගැටළුවක් බැවින්,විගණන කමිටුවෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරමි. |
| (iii) | මුදල් රෙගුලාසි 571 | තැන්පත් කර වසර 02 ක් ඉක්මවූ රු.246,576 ක පොදු තැන්පත් 26 ක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | නියාදනය කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල බාහිර පාර්ශවයන් වෙත දැනුවත් කර නිවැරදි කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,069,852 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,166,523 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය ආදායම | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 319,156 | 521,457 | 338,002 | 183,454 | 3,354,831 | 521,813 | 393,166 | 128,646 |
| ii. | කුලී | 17,096,000 | 9,370,872 | 9,334,372 | 36,500 | 13,453,158 | 6,948,890 | 6,905,348 | 43,542 |
| iii | වෙනත් ආදායම් | 22,781,800 | 3,183,974 | 1,538,552 | 1,645,422 | 15,126,093 | 2,622,264 | 1,354,098 | 1,268.166 |
| | | 40,196,956 | 13,076,303 | 11,210,926 | 1,865,376 | 31,934,082 | 10,092,967 | 8,652,612 | 1,440,354 |

**2.2.2** <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

**2.2.3** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට බිල් කරන ලද රු.13,076,303 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු. 1,865,376 ක් අයකර නොතිබුණු අතර,එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 14 ක් විය. | හිඟ ආදායම් අය කරගත යුතුවේ. | ඉදිරියේදී අය කර ගැනිමට කටයුතු කරමි. |
| (අ) | වසරකට අධික කාලයක සිට පැවත එන ලැබිය යුතු හිඟහිටි වරිපනම්, හිඟ හිටි ප්‍රාග්ධන ආධාර, හිඟහිටි වෙනත් ආදායම්, කඩ කුලී, ටෙන්ඩර් කඩ ගාස්තු, ජල ගාස්තු හා හිඟ අක්කර බදු එකතුව රු.1,332,864 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කරමි. |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ උසාවි දඩ රු.5,616,541 ක් හා හිඟ මුද්දර ගාස්තු රු.5,175,283 ක් විය. | අයවිය යුතු හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනිමට කටයුතු කරමි. |

**3.** <u>මෙහෙයුම් සමාලෝචනය</u>

**3.1** <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන්,ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>ක්‍රියාකාරි සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වර්ෂයට අදාලව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කිරීමට නිලධාරින් දැනුවත් කර ඇත. |

(ආ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද,සභාවට අදාළ කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පැහැදිලිව හඳුනා ගෙන හා ඒවා මැනීම සඳහා දර්ශකද හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරමි. |

**(ඇ)** **<u>අරමුණුගත කාර්යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ රු.5,599,209 ක් වැය කර කාබනික පොහොර නිෂ්පාදන අංගනයක් ඉදිකර තිබුණු අතර, ඒ සඳහා විදුලිය පහසුකම් ලබා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය දක්වා එම කටයුතු ආරම්භ කර නොතිබුණි. | විදුලිය පහසුකම් ලබාගෙන ප්‍රතිචක්‍රීයකරණ කටයුතු විධිමත් කළ යුතුවේ. | දැනට ශ්‍රමිකයන් මඟින් ප්‍රතිචක්‍රීයකරණ කටයුතු සිදු කරන අතර, ඉදිරියේදී විදුලිබලය ලබාගෙන ප්‍රතිචක්‍රීයකරණ කටයුතු විදුලි බලය භාවිතයෙන් සිදු කරමි. |

(ඈ) <u>පාරිසරික ගැටළු</u>

| **විගණන නිරීක්ෂණය** | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **පරිසරයට හානිවන ද්‍රව්‍ය හා ඝණ අපද්‍රව්‍ය පාලනයකින් තොරව පරිසරයට මුදාහැර තිබුණි.** | පාරිසරික පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී විදුලි බලය ලබාගෙන ප්‍රතිචක්‍රීයකරණ කටයුතු සාර්ථකව සිදු කරමි. |

**3.2** **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසරකට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු විවිධ ණයහිමි රු.15,377,279 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළයුතුවේ. | ආයතන වලින් මුදල් ලැබුණු වහාම ගෙවීම් සිදු කරමි. |

**3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 02 කට අදාල 03 ක් වූ අතිරික්ත කාර්ය මණ්ඩලය අනුමත කරගෙන නොතිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩල තනතුරු අනුමත කරව ගත යුතුවේ. | පෙර පාසැල් 06 ක් පවතින බැවින්, ගුරුවරුන් 06 දෙනෙකුගේ අවශ්‍යතාවයක් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 05 කට අදාළව පුරප්පාඩු 05 ක් සම්පූර්ණ කර ගෙන නොතිබුණි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | තනතුරක් සඳහා අනියම් සේවකයින් 02 ක් යොදවා ඇති අතර,එක් තනතුරක පුරප්පාඩු පුරවා ඇත.බවත්,ඉතිරි පුරප්පාඩු 03 ක අවශ්‍යතාවය පෙන්වා දී ඇත. |

**3.4 <u>වත්කම් කළමනාකරණය</u>**

**<u>නිෂ්ක්‍රීය වත්කම්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 වර්ෂයේ සභාවට ලැබී තිබුණු පිරිවැය රු.875,000 ක් වූ මාර්ග තලනය සමාලෝචිත වර්ෂය දක්වා නිෂ්ක්‍රීයව පැවතුණි. | නිෂ්කාර්ය වත්කම් ප්‍රයෝජනයට ගත යුතුවේ. | යන්ත්‍රය අලුත්වැඩියා කළයුතු බැවින්, ඉදිරියේදී අලුත්වැඩියා කිරිමට කටයුතු කරමි. |

**3.5 <u>ප්‍රසම්පාදනය</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදනය සැලැස්මක් පිළියෙල කල යුතුවේ. | පිළිතුරු ලබාදී නොමැත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ------------------------------ | -------------------- | ------------------------------ |
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණනයක් සඳහා සභාව සූදානම්ව සිටිය නමුත්, සිදුකර නොමැත. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ---------------------------------------- | ------------------ | ------------------ |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛ අංක ඩීඑම්ජී/2009(01) දරන 2009 ජුනි 09 දිනැති අභ්‍යන්තර විගණන චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක් හෝ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |